# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ
# மாவட்ட செயலகம் – கொழும்பு
# DISTRICT SECRETARIAT – COLOMBO

ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 எல்விடிகல மாவத்தை, நாராஹென்பிட்டி, கொழும்பு 05 Elvitigala Mw, Narahenpita, Colombo 05
විද්‍යුත් තැපැල மின்னஞ்சல் E-mail: ds@colombo.dist.gov.lk වෙබ් අඩවිය இணையத் தளம் Web site: colombo.dist.gov.lk


මගේ අංකය / எனது இல / My No: DIST/CMB/FIE/NL PROJECT /2023
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.08.

උප කුලපති

සෞන්දර්ය විශ්වවිද්‍යාලය /කොළඹ විශ්ව විද්‍යාලය
කොළඹ

<u>රාජ්‍ය සේවා ප්‍රවර්ධනය සඳහා ඒකාංගික ටෙලිනාට්‍ය තරඟාවලියක් හා ඉංග්‍රීසි කෙටි චිත්‍රපට තරඟාවලියක් පැවැත්වීම.</u>

රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් රාජ්‍ය භාෂා ප්‍රවර්ධනය සඳහා ඒකාංගික ටෙලිනාට්‍ය තරගාවලියක් හා ඉංග්‍රීසි කෙටි චිත්‍රපට තරගාවලියක් පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.

(2) උක්ත අමාත්‍යාංශය මගින් අදාල නිර්ණායක හා අයදුම් පත්‍ර යොමු කිරීම පිළිබඳ විස්තර ඉදිරිපත් කර ඇත. (එම ඇමුණුම් මේ සමඟ ඔබවෙත එවමි.

(03) මේ සම්බන්ධයෙන් ඔබ විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කරණ මෙන් කාරුණිකව දන්වා සිටිමි.

SSC

එම්.ඒ.එස්. කාංචනා ගුණවර්ධන
අතිරේක දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කොළඹ.

VC

දුරකථනය - 0112-2055715
ෆැක්ස් - 0112-2055711
විද්‍යුත් ලිපිනය - distcmbads2@gmail.com


| | | | |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephone | කාර්යාලය / அலுவலகம் / Office: 0112 369134 | දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / District Secretary: 0112 369139 | අතිරේක දිස්ත්‍රික් ලේකම් / மேலதிக மாவட்ட செயலாளர் / Addl. District Secretary: 0112 369136 |
| ෆැක්ස් / தொலைநகல் / Fax: 0112 369142 | ප්‍රධාන ගණකාධිකාරී / தலைமைக் கணக்காளர் / Chief Accountant: 0112 369143 | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) / பணிப்பாளர் (திட்டமிடல்) / Director (Planning): 0112 369147 | අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / பணிப்பாளர் (விவசாயம்) / Director (Agriculture): 0112 369311 |





UNIVERSITY OF COLOMBO RECEIVED 24 AUG 2023 VICE CHANCELLORS OFFICE (3)
STUDENT COUNSELLORS' OFFICE RECEIVED 25 AUG 2023 UNIVERSITY OF COLOMBO

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ජාතික භාෂා අංශය தேசிய மொழிகள் பிரிவு National Languages Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது.இல<br>My No. | PS/NLD/ADM/07/PR | ඔබේ අංකය<br>உமது .இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.05. 22 |

දිස්ත්‍රික් ලේකම් මගින්
ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කොළඹ..................

<u>රාජ්‍ය භාෂා ප්‍රවර්ධනය සඳහා ඉංග්‍රීසි කෙටි චිත්‍රපට තරඟාවලියක් පැවත්වීම.</u>

ජාතික භාෂා අංශයේ 2023 ක්‍රියාකාරී සැලස්මේ එක් ක්‍රියාකාරකමක් ලෙස උක්ත තරඟාවලිය පැවැත්වීමට නියමිත අතර, එමගින් ශ්‍රී ලංකාව තුළ සිංහල, දෙමළ භාෂා මෙන්ම සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව ද ප්‍රවර්ධනය කිරිම තුළින් ජාත්‍යන්තරය ජය ගැනීමට වේදිකාවක් නිර්මාණය කරදීම මෙහි අරමුණ වේ. තවද, සමාජයට සුබවාදී පණිවුඩයක් ලබා දෙමින් දේශීය කෙටි චිත්‍රපට කර්මාන්තය නඟා සිටුවීමට ගත් ප්‍රයත්නයක් වශයෙන් ද මෙය හැඳින්විය හැක.

02. මෙම තරඟාවලිය විවෘත තරඟාවලියක් ලෙස පැවත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර, ඉංග්‍රීසි මාධ්‍ය යොදා ගනිමින් සිංහල හා දෙමළ උපසිරැසි සහිතව ප්‍රේක්ෂකයාගේ රසාස්වාදය කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කළ හැකි ගුණයෙන් හා හරයෙන් යුත් නිර්මාණ ඉදිරිපත් කළ යුතු වේ. තරඟයට අදාළ නිර්ණායක හා අයදුම්පත්‍රය මේ සමඟ අමුණා ඇති අතර, තරඟ නීති රීති හා කොන්දේසිවලට අනුගත වෙමින් ඉංග්‍රීසි කෙටි චිත්‍රපට සැකසිය යුතු වේ. (ඇමුණුම 01, 02 සහ 03)

03. සංස්කරණය කරන ලද ඉංග්‍රීසි කෙටි චිත්‍රපටය DVD සංයුක්ත තැටියක් මගින් තිර පිටපත, රංගන ශිල්පීන්ගේ නාම ලේඛනය හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ හා අත්සන සමඟ අයදුම්පත්‍රය ද 2023.08.31 වන දින හෝ ඊට පෙර "අතිරේක ලේකම් ( රාජ්‍ය සේවා, ප්‍රතිසංස්කරණ හා ජාතික භාෂා), ජාතික භාෂා අංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 " ලිපිනයට යොමු කළ යුතු බව කාරුණිකව දන්වමි. නිර්මාණ යොමු කිරීමෙන් පසු එහි පූර්ණ අයිතිය අමාත්‍යාංශය සතු වන අතර ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් ජයග්‍රාහී නිර්මාණ තෝරා ගැනීම සිදු කර සහතික හා ත්‍යාග ප්‍රදානය කිරීමට නියමිතය.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011269621l-13<br>011-2166000<br>011-3091295<br>011-2684223 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2683132 | විද්‍යුත් තැපෑල<br>மின்னஞ்சல்<br>E-mail | div-nlg@pubad.gov.lk | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.pubad.gov.lk |

04. එබැවින් මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා ඔබ දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් පුළුල් ප්‍රචාරයක් ලබා දී නිර්මාණ ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු අතර, මේ සම්බන්ධයෙන් වැඩිමනත් තොරතුරු අවශ්‍ය වන්නේ නම් ජාතික භාෂා අංශයේ සංවර්ධන නිලධාරී බී.ආර්.රාජපක්ෂ මහත්මියගේ දුරකථන අංක 0701294286 ඇමතීමෙන් හෝ langdiv2018@gmail.com යන විද්‍යුත් තැපැල මඟින් ලබා ගත හැකි බවද වැඩිදුරටත් දන්වමි.


අනුරාධ විජේකෝන්
අතිරේක ලේකම් (රාජ්‍ය සේවා, ප්‍රතිසංස්කරණ හා ජාතික භාෂා)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ලේකම් වෙනුවට

දුරකථන අංක : 011-2676433
ෆැක්ස් : 011-2698429
විද්‍යුත් ලිපිනය : adsecnlg@pubad.gov.lk

ඇමුණුම 01

<u>ඉංග්‍රීසි කෙටි චිත්‍රපට තරඟයක් පැවැත්වීමට අදාළ නිර්ණායක</u>

වයස් සීමාව - විවෘත

ධාවන කාලය - අවම වශයෙන් විනාඩි 03 ට නොඅඩු හා උපරිම විනාඩි 15 ට නොවැඩි විය යුතුයි.

සහභාගී වන සංඛ්‍යාව - සීමාවක් නැත.

කැමරාකරණ මාධ්‍ය - ජංගම දුරකථනය

<u>කෙටි චිත්‍රපට තරඟයට අදාළ සංදර්භය</u>

- භාෂාවක ජීව ගුණය රඳා පවතින්නේ එය භාවිතයේ පවතින තාක්කල් පමණි. ජීව භාෂාවන් හැම විටම සංවර්ධනය විය යුතු අතර නව්‍ය විය යුතුය. නිවරදි භාෂා භාවිතය තුළින් ජනතාවගේ සංයමය, සංහිඳියාව හා උගත්කම පෙන්නුම් කරයි. සජීවී භාෂාවන් පෝෂණය වීමේදී ජාත්‍යන්තර භාෂාවන්ගේ බලපෑම හා අභාසය අත්‍යවශ්‍ය වේ. විශ්ව භාෂාවක් ලෙස සැලකෙන ඉංග්‍රීසි භාෂාවේ වචන භාෂා ව්‍යවහරයට ඇතුළත්ව ඇත. ඉංග්‍රීසි භාෂාව වර්තමානයේ අත්‍යවශ්‍ය භාෂාවක් වී ඇති අතර, නවීන ලෝකයේ මෙම භාෂාවට ප්‍රමුඛත්වය හිමිව ඇත. ජාත්‍යන්තර වෙළඳපළ ජයගැනීමට නම් මෙම භාෂාව ප්‍රගුණ කළ යුතුය. එබැවින් ආර්ථික ජයග්‍රහණ අත්කර ගැනීම සඳහා නිර්මාණශීලී තාරුණ්‍යයක් ගොඩ නැගීම සඳහා ඉංග්‍රීසි භාෂාව මඟින් පිටුබලයක් ලැබෙනු ඇත. භාෂාවක් දැන ගැනීම මඟින් එකිනෙකා අතර අදහස් හුවමාරු කර ගැනීමට හැකියාව පවතින අතර, ඒ තුළින් අන්‍යෝන්‍ය විශ්වාසය ගොඩ නැංවීමට හා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට හැකි වේ. එමෙන්ම මෙම නිර්මාණ තුළින් ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගත් විශ්ලේෂණය (Gender based analysis plus) ගම්‍ය විය යුතුය. මෙම සන්දර්භය තුළ ඔබගේ නිර්මාණ ඉදිරිපත් කළ යුතු අතර, එයට සුදුසු මාතෘකාවක් යෙදිය යුතුය.

## තරඟයට අදාළ නීති රීති හා කොන්දේසි

- තරඟය සඳහා ඕනෑම ශෛලියක් ඔස්සේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි අතර රූප රාමුවේ ප්‍රමාණය PX 1920x1080 (තිරස් හා සිරස් ) විය යුතුයි.
- කැමරකරණයේදී කෙටි චිත්‍රපටයේ ප්‍රමිතියට Water Mark හරහා නිර්මාණයේ ප්‍රමිතියට බාධාවක් නොවිය යුතුයි.
- කෙටි චිත්‍රපටයේ ධාවන කාලය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
- මෙම අමාත්‍යංශය තුළින් සමාජයට ලබා දෙන පණිවුඩය ප්‍රේක්ෂකයා අතර ප්‍රවර්ධනය කිරීමට සුදුසු සුබාන්ත නිර්මාණයක් විය යුතුය.
- ස්ත්‍රී, පුරුෂ, වෙනත් හා සියලුම ජාතීන් නියෝජනය වන පරිදි නිර්මාණය සැකසිය යුතු වේ.
- කතා සන්දර්භය සමාජ, සංස්කෘතික හා දේශපාලන මතිමතාන්තර වලින් තොර නිර්මාණයක් විය යුතු අතර කිසිදු ජන කණ්ඩායමක් අගතියට පත්වන තර්ජනාත්මක ප්‍රකාශනයන්, වෙනස්කොට සැලකීම් වලින් තොර නිර්මාණයක් විය යුතු වේ.
- කතා සන්දර්භය තුළ ඇති අනන්‍යතාව කෙරෙහි දැඩි අවධානයක් යොමු කරනු ලබන අතර පරිකල්පන ශක්තිය නිර්මාණය තුළින් මනාව ඉදිරිපත් කළ යුතු වේ.
- නිර්මාණය සඳහා අවතීර්ණ වන ආකාරය, කතා සන්දර්භය ඉදිරියට ගෙන යාම සඳහා යොදා ඇති උපක්‍රම, නිර්මාණයේ රසාස්වාදය ප්‍රවර්ධනය සඳහා යොදා ඇති උපක්‍රම සඳහා ප්‍රධාන අවධානයක් යොමු කරනු ලැබේ.
- චිත්‍රපටය සඳහා යොදා ගන්නා පසුබිම් සංගීතය තුළින් චිත්‍රපටයේ දෙබස්වල ගුණාත්මක භාවයට බාධාවක් නොවිය යුතුය.
- වීඩියෝකරණයේ ගුණාත්මක භාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.
- නිර්මාණය සඳහා යොදා ගන්නා භාෂා මාධ්‍ය ප්‍රේක්ෂක රසාස්වාදයට බාධාවක් නොවන ගුණාත්මක භාෂා රටාවකින් සමන්විය යුතු වේ.
- මෙය ස්වකීය නිර්මාණයක් විය යුතු අතර, මීට පෙර මෙරට හෝ වෙනත් රටක නිර්මාණකරුවන් විසින් කරන ලද නිර්මාණයක පරිවර්තනයක් හෝ අනුවර්තනයක් නොවිය යුතුයි.
- නිර්මාණය ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් ඉදිරිපත් විය යුතු අතර සිංහල හා දෙමළ උපසිරැසි සහිතව ඉදිරිපත් කළ යුතු වේ.
- තිර පිටපත ඉංග්‍රීස් භාෂා මාධ්‍යයෙන් ඉදිරිපත් කළ යුතු වේ

ඇමුණුම 02

<u>පොදු කරුණු</u>

- සියලුම නිර්මාණ MP4 Video ක් ලෙස DVD සංයුක්ත තැටියක් මඟින් ඉදිරිපත් කළ යුතුයි.
- ජාතික භාෂා අංශය මඟින් ආරම්භ කිරීමට නියමිත You Tube චැනලය සඳහා Videos Upload කරන බැවින් මෙම නිර්මාණයෙහි ප්‍රමිතිය පිළිබඳ සැලකිලිමත් වනු ලැබේ.
- මෙම නිර්මාණ ජාතික භාෂා අංශය වෙත යොමු කළ පසු එය භාෂා ප්‍රවර්ධන වැඩසටහන් වලට යොදා ගැනීමට අවකාශ තිබිය යුතුය.

<u>නිර්මාණය ඉදිරිපත් කළ යුතු ක්‍රමවේදය</u>

- සංස්කරණය කරන ලද ඉංග්‍රීසි කෙටි චිත්‍රපටය DVD සංයුක්ත තැටියක් මඟින් තිර පිටපත, රංගන ශිල්පීන්ගේ නාම ලේඛනය හා ප්‍රාදේශීය ලේකම් තුමා/ තුමියගේ නිර්දේශ හා අත්සන සමඟ අයදුම්පත්‍රය ද පහත ලිපිනයට යොමු කළ යුතුය.
- එසේ නොවුන හොත් ඔබ විසින් නිර්මාණය කරන ලද කෙටි චිත්‍රපටය

  අතිරේක ලේකම් ( රාජ්‍ය සේවා, ප්‍රතිසංස්කරණ හා ජාතික භාෂා)<br>
  රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>
  ජාතික භාෂා අංශය<br>
  නිදහස් චතුරශ්‍රය<br>
  කොළඹ 07
- නිර්මාණය තෝරාගත් බව දැනුම් දුන් පසු සකසන ලද ඉංග්‍රීසි කෙටි චිත්‍රපටයට අදාළ පෝස්ටරය අප වෙත ලැබීමට සැලැස්විය යුතු අතර එම නිර්මාණය සම්මාන උත්සවයේදී ප්‍රේක්ෂකයින් සඳහා ප්‍රදර්ශනය කෙරේ.
- අවසන් දිනට පසු යොමු කරන ලද නිර්මාණ සහ පරිවර්තනය හෝ අනුවර්තනය කරන ලද නිර්මාණ කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ජාතික භාෂා අංශය தேசிய மொழிகள் பிரிவு National Languages Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது.இல / My No. — PA/NLD/DRV/04/01/2023 | ඔබේ අංකය / உமது .இல / Your No. | දිනය / திகதி / Date — 2023.05.11 |

දිස්ත්‍රික් ලේකම් මගින්
ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කොළඹ

**රාජ්‍ය භාෂා ප්‍රවර්ධනය සඳහා ඒකාංගික ටෙලි නාට්‍ය තරඟාවලියක් පැවැත්වීම.**

ජාතික භාෂා අංශයේ 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව උක්ත තරඟාවලිය පැවැත්වීමේ ක්‍රියාකාරකම අන්තර්ගත කර ඇති අතර, භාෂාව හා සංස්කෘතිය අතර ඇති සබැඳියාව හා මනා අවබෝධය, භාෂා භාවිතය පිළිබඳ ශක්‍යතාව, තිරසාර සාමය හා සංහිඳියාව අගය කරන සමාජ පසුබිමක් නිර්මාණය, කලාව තුළින් ඔප් නැංවීම මෙහි ප්‍රධාන අරමුණු ලෙස හඳුනාගෙන ඇත.

02. මෙම තරඟාවලිය විවෘත තරඟාවලියක් ලෙස පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර සිංහල හා දෙමළ යන මාධ්‍ය දෙකම භාවිත කරමින් ප්‍රේක්ෂකයාගේ රසාස්වාදය කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කළ හැකි ගුණයෙන් හා හරයෙන් යුත් නිර්මාණ ඉදිරිපත් කළ හැකිය. තරඟයට අදාළ නිර්ණායක හා අයදුම්පත්‍රය මේ සමඟ අමුණා ඇති අතර තරඟ නීති රීති හා කොන්දේසිවලට අනුගත වෙමින් ඒකාංගික ටෙලි නාට්‍ය සැකසිය යුතුය. (ඇමුණුම 01 හා 02)

03. සංස්කරණය කරන ලද ඒකාංගික ටෙලි නාට්‍ය DVD සංයුක්ත තැටියක් මගින් තිර පිටපත හා අයදුම්පත්‍රය ද සමඟ 2023.08.31 වන දිනට පෙර හෝ එදිනට අතිරේක ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ජාතික භාෂා අංශය නිදහස් චතුරස්‍රය, කොළඹ 07 යන ලිපිනයට යොමු කළ යුතු බව කාරුණික දන්වමි. නිර්මාණය යොමු කිරීමෙන් පසු එහි සම්පූර්ණ අයිතිය අමාත්‍යාංශය සතුවන අතර ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් ජයග්‍රාහී නිර්මාණ තෝරා ගැනීම සිදු කර සහතික හා ත්‍යාග ප්‍රදානය කිරීමට ද නියමිතය.

04. එබැවින් මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා ඔබ දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් පුළුල් ප්‍රචාරයක් ලබා දී නිර්මාණ ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු අතර මේ සම්බන්ධයෙන් වැඩිමනක් තොරතුරු අවශ්‍ය වන්නේ නම් ජාතික භාෂා අංශයේ සංවර්ධන නිලධාරී දිනුෂා හර්ෂණී මහත්මියගේ දුරකථන අංක 0717279917 ඇමතීමෙන් හෝ langdiv2018@gmail.com යන විද්‍යුත් තැපැල මගින් ලබා ගත හැකි බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

අනුරාධ විජේකෝන්
අතිරේක ලේකම් (රාජ්‍ය සේවා, ප්‍රතිසංස්කරණ හා ජාතික භාෂා)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙනුවට

දුරකථන :011-2676433
ෆැක්ස් : 011-2698429
විද්‍යුත් ලිපිනය : adsec-nlg@pubad.gov.lk

දුරකථන / தொலைபேசி / Telephone: 0112696211-13, 011-2166000, 011-3091295, 011-2684223
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2683132
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: div-nlg@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk

<u>ඒකාංගික ටෙලි නාට්‍ය තරඟය පැවැත්වීමට අදාළ නිර්ණායක</u>

| | | |
|---|---|---|
| වයස් සීමාව | - | විවෘත |
| මාධ්‍ය | - | සිංහල / දෙමළ |
| කාලය | - | විනාඩි 23 කට සීමා වන පරිදි |

<u>ඒකාංගික ටෙලි නාට්‍යයේ සන්දර්භය</u>

- ශ්‍රී ලංකාව බහු වාර්ගික, බහු භාෂික, බහු ආගමික, බහු සංස්කෘතික රටකි. ඉතිහාසයේ විවිධ කාල වකවානු දෙස බැලීමේදී භාෂාව මුල් කරගත් සිවිල් අරගල නිර්මාණය වූ බැවින් රටේ සංවර්ධනය ලෝකයේ අනෙක් රටවලට සාපේක්ෂව විශාල පසුබෑමකට ලක්වී ඇත. ජාතීන් අතර විශ්වාසය හා අන්‍යෝන්‍යය අවබෝධය පළුදු වීමකට ලක් වුණු අතර ශ්‍රී ලාංකේය ජාතියක් ලෙස ලෝකය ඉදිරියේ නැඟී සිටීමට එය බාධාවක් බවට පත් විය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ නෛතික විධිවිධාන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ භාෂාව මූලික අයිතිවාසිකම ලෙස ද IV වන පරිච්ඡේදයේ භාෂා අයිතිය සුරක්ෂිත කිරීමද සිදු කර ඇත.

- එමෙන්ම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සිංහල හා දෙමළ භාෂාව රාජ්‍ය භාෂා ලෙසද ඉංග්‍රීසි භාෂාව සන්ධාන භාෂාව ලෙසද හඳුනාගැනීමට සියලු විධිවිධාන සලස්වමින් භාෂාව සියලු පුරවැසියනගේ මූලික අයිතිවාසිකමක් ලෙස නිර්වචනය කර ඇත. මෙකී භාෂාත්‍රය පිළිබඳවම අවධානය යොමු කර ඇති අතර වර්තමානය දක්වාම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ. නමුත් සමාජය ඇතුලාන්තයේ තවමත් නොවිසිඳුණු විවධ ප්‍රශ්ණ, ගැටළු, අර්බුද රාශියක් පවතී. නිර්මාණාත්මක කලා මාධ්‍යයන් භාවිතා කර මෙම ගැටළු ශ්‍රී ලාංකේය ජාතියක් ලෙස සාර්ථකව ජය ගැනීමට හැකිය. ඒ අනුව නිර්මාණාත්මක ලෙස භාවිතා කළ හැකි එක් ප්‍රබල කලා අංගයක් ලෙස ඒකාංගික ටෙලි නාට්‍ය හඳුන්වා දිය හැකිය. එමඟින් ශ්‍රී ලාංකේය අනන්‍යතාව සුරකිමින් විවිධත්වය ශක්තියක් කර ගනිමින් ප්‍රජාවට සුභවාදී හා ඵලදායී යහපත් වූ සමාජමය පණිවුඩයක් නිර්මාණය කර ගත යුතු වේ.

- විවිධ ජාතීන්ට අයත් මිනිසුන්ට වෛර කරමින්, ද්වේශ කරමින් මෙම අභියෝගය ජය ගත නොහැකි අතර ඒ සඳහා සරල සුගම සංවේදී මාධ්‍ය භාවිත කිරීම තුළින් ජයග්‍රහණයේ අරුනළු ළගා කර ගත හැකි බව අවබෝධ කර ගනිමින් සඵලදායී නිර්මාණාත්මක ප්‍රයත්නයක් සඳහා මංපෙත් විවර විය යුතුය. එමෙන්ම භාෂාව , සන්නිවේදනය, සහජීවනය පිළිබඳ සමාජයට වටිනා පණිවුඩයක් ලබා දීම හා ටෙලි නාට්‍යයේ අවසානය සුඛාන්ත වීම මේ තුළින් බලාපොරොත්තු වන අතර ඒ සඳහා නිර්මාණශීලි තේමාවන් නිර්මාණය කර ගත යුතුය. එමෙන්ම මෙවැනි නිර්මාණ තුළින් යහපත් ආර්ථික පරිසරයක් ද නිර්මාණය කර ගත හැකි අතර සමාජ මාධ්‍ය ජාලා හරහා විකාශය කිරීමෙන් ජාත්‍යානතරය දිනා ගැනීමටද හැකි වේ.

<u>තරඟය සඳහා අයදුම් කිරීම</u>

- මෙ සමඟ අමුණා ඇති ඉල්ලුම් පත්‍රය මඟින් තරඟය සඳහා අයදුම් කළ හැකිය.

---

තරඟයට අදාළ නීති රීති හා කොන්දේසි

- තරඟය සඳහා ඕනෑම නාට්‍ය ශෛලියක් ඔස්සේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි අතර රූපරාමුවේ ප්‍රමාණය 1920 X1080 Px (තිරස් හා සිරස්) විය යුතුය.
- ඒකාංගික ටෙලි නාට්‍යය ඉහළම ගුණාත්මක භාවයෙන් යුක්ත විය යුතුය (At least High Definition 4K / 5K ..)
- කැමරාකරණයේදී ඒකාංගික ටෙලි නාට්‍යයේ ප්‍රමිතියට "Water Mark" හරහා නිර්මාණයේ ප්‍රමිතියට බාධාවක් නොවිය යුතුය.
- ඒකාංගික ටෙලි නාට්‍යයේ ධාවන කාලය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
- ස්ත්‍රී පුරුෂ, වෙනත් හා සියලු ජාතීන් නියෝජනය වන පරිදි නිර්මාණය සැකසිය යුතු අතර ඕනෑම පසුතලයක් භාවිතා කර ගත හැකිය.
- නිර්මාණය කරන ඒකාංගික ටෙලි නාට්‍ය තේමාව, කතා වස්තූන්, දෙබස් ආදිය කිසියම් ජන කණ්ඩායමකටම බලපෑමක් ඇති නොවන ලෙස හෝ වෙනත් සමාජ විරෝධී අරමුණුවලට තුඩු නොදෙන, එවැනි අදහස් ගම්‍ය නොවන ඒවා විය යුතු අතර එවනි අදහස් අර්ථකථනය නොවිය යුතු වේ.
- තමන් අයත්වන හෝ නියෝජනය වන ජාති, ආගම, සංස්කෘතික හා දේශපාලනික මතිමතාන්තර හේතු කරගෙන කිසියම් සමාජ කණ්ඩායමක් අපසහසුවට ලක්විය හැකි ආකාරයේ ඉදිරිපත් කිරීම්වලින් වැලකිය යුතු වේ.
- සියලු නිර්මාණයන් අවර ගණයේ භාෂා ව්‍යවහාරයන්ගෙන් තොර විය යුතු අතර භාෂාව භාවිතයේදී විශේෂ අවධානයක් යොමු කළ යුතුය.
- මෙය ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතු අතර මීට පෙර නිර්මාණකරුවන් විසින් නිර්මාණය කරන ලද පිටපත් රචනයක් හා පරිවර්තනයතක් නොවිය යුතු අතර ස්වතන්ත්‍ර නිර්මාණයක් බවට තමා විසින්ම සහතික කළ යුතු වේ.
- සමාජ වටපිටාව සමඟ ගවේශනශීලි වීම මඟින් වඩාත් යහපත්, ඵලදායී සංකල්පයක් නිර්මාණය කර ගැත හැකිය (අදාළ පුද්ගලයන් සමඟ සාකච්ඡා කිරීම, පොත් කියවීම, අන්තර්ජාලය පරිශීලනය ආදී)
- තරඟය සඳහා ඉහත නිර්ණායක යටතේ නිර්මාණය ඉදිරිපත් කළ යුතු අතර ඔබගේ රුචිකත්වය මත සංගීත නිර්මාණ ඉදිරිපත් කළ හැකි අතර එසේ ඉදිරිපත් නොකරන්නේ නම් හොඳම පසුබිම් සංගීතය යන අංගය සඳහා ඇගයීමට ලක්නොවනු ඇත.
- නිර්මාණය සිංහල භාෂාවෙන් ඉදිරිපත් කරන්නේ නම් දෙමළ උප සිරස සහිතවද දමිළ භාෂාවෙන් ඉදිරිපත් කරන්නේ නම් සිංහල උප සිරස ඇතුළත් කළ යුතු වේ.
- තිර පිටපත ද්වි භාෂාවෙන්ම (සිංහල හා දෙමළ) ඉදිරිපත් කළ යුතුය.
- ත්‍රෛභාෂාවම නියෝජනය වන පරිදි සකස් කරන ලද දෙබස් නිර්මාණය සඳහා යොදා ගත හැකිය.
- ඉදිරිපත් කරන නිර්මාණය සමාජයට සුභවාදී පණිවුඩයක් ලබා දිය හැකි ප්‍රශස්ත නිර්මාණයක් විය යුතුය.

- ඒකාංගික ටෙලි නාට්‍යයේ අන්තර්ගතය හා තාක්ෂණික ගුණාත්මකභාවය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වන අතර එසේ නොවන නිර්මාණ විනිශ්චය මණ්ඩලයේ තීරණය මත ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වන බැවින් ඒ සඳහා කිසිදු බලපෑමක් සිදු කළ නොහැකිය.

<u>පොදු කරුණු</u>

- අමාත්‍යාංශයේ ජාතික භාෂා අංශය මගින් ආරම්භ කිරීමට නියමිත YouTube චැනලය සඳහා videos upload කරන බැවින් එම ඒකාංගික ටෙලි නාට්‍ය ප්‍රශස්ත මට්ටමක තිබීම වැදගත් වන අතර එම නිර්මාණය අමාත්‍යාංශය වෙත යොමු කළ පසු එම නිර්මාණවල පූර්ණ අයිතිය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සතු වේ.

<u>නිර්මාණය ඉදිරිපත් කළ යුතු ක්‍රමවේදය</u>

1. සංස්කරණය කරන ලද ඒකාංගික ටෙලි නාට්‍ය DVD සංයුක්ත තැටියක් මගින් තිර පිටපත හා අයදුම්පත්‍රය ද සමඟින් පහත ලිපිනයට යොමු කළ යුතුය.

   අතිරේක ලේකම් (රාජ්‍ය සේවා, ප්‍රතිසංස්කරණ හා ජාතික භාෂා)
   රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
   ජාතික භාෂා අංශය
   නිදහස් චතුරශ්‍රය
   කොළඹ 07

2. නිර්මාණය තෝරාගත් බව දැනුම් දුන් පසු සකසන ලද ඒකාංගික ටෙලි නාට්‍යයට අදාළ පෝස්ටරය අප වෙත ලැබීමට සැලැස්විය යුතු අතර එම නිර්මාණය සම්මාන උත්සවයේදී ප්‍රේක්ෂකයින් සඳහා ප්‍රදර්ශනය කෙරේ.

3. අවසන් දිනට පසු යොමු කරන ලද නිර්මාණ ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

<u>සම්මාන හා සහතික පිරිනැමීම</u>

- යොමු කරන ලද සියලු ඒකාංගික ටෙලි නාට්‍ය ප්‍රවීණ තරඟ විනිශ්චය මණ්ඩලයක් මගින්
  - හොඳම නාට්‍ය (ප්‍රථම,දෙවන,තෙවන)
  - හොඳම නළුවා, හොඳම නිළිය
  - හොඳම සහය නළුවා සහ නිළිය
  - හොඳම තිර රචනය
  - හොඳම අංග රචනය
  - හොඳම රූප රචනය
  - හොඳම ආලෝකකරණය
  - හොඳම කැමරා අධ්‍යක්ෂණය
  - හොඳම සංස්කරණය
  - හොඳම අධ්‍යක්ෂණය
  - හොඳම පසුබිම් සංගීත අධ්‍යක්ෂණය

  යන අංග යටතේ තෝරා ගැනීම සිදු කරන අතර අමාත්‍යාංශය මගින් ත්‍යාග හා සහතික පත්‍රයක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

ඇමුණුම 02

<u>ඒකාංගික ටෙලි නාට්‍ය තරඟය සඳහා ඉදිරිපත් වීමේ අයදුම් පත්‍රය</u>

සම්පූර්ණ නම :-

ලිපිනය හා දුරකථන අංකය :-

උපන් දිනය :-

විද්‍යුත් තැපැල :-

දිස්ත්‍රික්කය :-

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-

ග්‍රාම නිලධාරී කොට්ඨාසය :-

ටෙලි නාට්‍යයේ මාතෘකාව :-

ඉදිරිපත්වන මාධ්‍ය :-

නාට්‍යයේ සාරාංශය :-

ධාවන කාලය :-

රංගන දායකත්වය (ප්‍රධාන චරිතයේ සිට අනු පිළිවෙළින් )

| අනු අංකය | චරිතය | රංගන ශිල්පියා /ශිල්පිණියගේ නම (මුලකුරු සමඟ) | ලිපිනය හා දුරකථන අංකය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |
| 9. | | | |
| 10. | | | |
| 11. | | | |
| 12. | | | |

| අනු අංකය | අනුෂාංගික අංග | නම (මුලකුරු සමඟ) | ලිපිනය හා දුරකථන අංකය |
|---|---|---|---|
| 1. | තිර රචනය | | |
| 2. | අධ්‍යක්ෂණය | | |
| 3. | සංස්කරණය | | |
| 4. | අංග රචනය | | |
| 5. | කැමරාකරණය | | |
| 6. | රූප රචනය | | |
| 7. | සංගීත අධ්‍යක්ෂණය | | |

ඉහත සඳහන් නිර්මාණය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ජාතික භාෂා අංශය මඟින් පවත්වනු ලබන ඒකාංගික ටෙලි නාට්‍ය තරඟය සඳහා මා විසින් නිර්මාණය කරන ලද ස්වතන්ත්‍ර නිර්මාණයක් බවත්, තරඟ නීති රීතිවලට එකඟවන බවත්, මීට පෙර එය කිසිම තරඟයකට හෝ ප්‍රදර්ශනයකට ඉදිරිපත් කර නොමැති බවත්, නිර්මාණය ඉදිරිපත් කිරීමෙන් පසු එම නිර්මාණය භාෂා ප්‍රවර්ධන කාර්යයන් සඳහා හෝ වෙනත් ඕනෑම කාර්යයක් සඳහා භාවිතා කිරීමට අමාත්‍යාංශයට පූර්ණ අනුමැතිය හිමිවන බවත්, ඒ සඳහා මාගේ විරුද්ධත්වයක් නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත් ප්‍රකාශ කරමි.

.....................  ..........................................

දිනය  නිර්මාණකරුගේ අත්සන